# පත්තිනි දේවිය ඇදහීම පිළිබඳ අධ්‍යයනයක්: නවගමුව පත්තිනි දේවාලය ඇසුරෙන්

**මාධවී නෙරංජනා චන්ද්‍රසේන**
**කැලණිය විශ්වවිද්‍යාලය**
***mchandrasena@yahoo.com***

මානව විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයන්හි සාකච්ඡාවට බඳුන්වන එක් සංකල්පයක් ලෙස, 'අභිචාර' හැඳින්විය හැකිය. අතීත ශ්‍රී ලංකා සමාජය තුළ පැවති මෙම අභිචාර විධි අතර ස්වභාව ධර්මය හා බැඳුණු වස්තූන් මෙන්ම විවිධ දෙවි දේවතාවන් ඇදහීම ද දක්නට ලැබුණි. ඒ අතුරින් පත්තිනි දේවියට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දක්නට ඇති පත්තිනි දේවාල අතර කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි 'නවගමුව' පත්තිනි දේවාලය ප්‍රධාන වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව සඳහා පදනම් වූයේ නවගමුව පත්තිනි දේවාලය හා ඒ හා බැඳුණු වත් පිළිවෙත් ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනයකි. අධ්‍යයනයට අදාළ පර්යේෂණ ගැටලුව ලෙස, 'වර්තමාන සමාජය තුළ තවදුරටත් මෙම වත් පිළිවෙත් කෙරෙහි නැඹුරුවක් පවතින්නේ ද' යන්න යොදා ගැනිණි.

අධ්‍යයනයේ අරමුණු වූයේ මේ පිළිබඳ ඓතිහාසික පසුබිම සොයා බැලීමත්, පත්තිනි දේවිය ඇදහීම සම්බන්ධයෙන් විවිධ බැතිමතුන්ගේ අපේක්ෂා, අවශ්‍යතා හා ඔවුන් දරන ආකල්ප පිළිබඳව විමසීමත් වේ.

මේ සඳහා අනුගමනය කරන ලද්දේ සමීක්ෂණ ක්‍රමවේදයයි. දත්ත ලබාගැනීමේ ශිල්පක්‍රම වූයේ සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණයයි. ඊට අමතරව, මේ සම්බන්ධයෙන් පළවී ඇති ග්‍රන්ථ හා ලිපිලේඛනද පරිශීලනය කරන ලදී. සමීක්ෂණයේ නියැදිය ලෙස, දේවාලය වෙත පැමිණි බැතිමතුන් අතුරින් අහඹු ලෙස තෝරා ගත් 50 දෙනෙකු සහභාගිකර ගැනිණි.

මෙම අධ්‍යයනයේ දී පෙනී ගියේ, වර්තමාන සමාජයේ මිනිසුන් තමන්ගේ කරදර කම්කටොලු, දුක්ඛ දෝමනස්සයන්ගෙන් මිදීම සඳහා සහ තම අභිමතාර්ථ මුදුන් පමුණුවා ගනිමින් ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආශිර්වාද ලබා ගැනීම සඳහාත් දේවාලය වෙත පැමිණෙන බවයි. සමාජය සංකීර්ණ වීමත් සමග මිනිසුන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් ද වෙනස් වී ඇති අයුරු මෙහි දී නිරීක්ෂණය විය. එමෙන්ම ඉතාමත් භක්තියෙන්, තම අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා බැතිමතුන් විශාල සංඛ්‍යාවක් දිනපතා මෙම ස්ථානය වෙත පැමිණෙන බව ද පෙනී ගියේය.

***ප්‍රමුඛ පද:*** *අභිචාර, පත්තිනි දේවිය, නවගමුව පත්තිනි දේවාලය, වත් පිළිවෙත්, බැතිමතුන්.*